24-07-2019

De mezenod college - kandana De mezenod college - kandana De mezenod college - kandana De mezenod -

NEW

# ද මැසිනොද් විද්‍යාලය - කඳාන
# De mezenod college - kandana

| 11 | S | I |
|---|---|---|

10 ශ්‍රේණිය

## දෙවන වාර පරීක්ෂණය - 2019

පැය තුනයි

## බුද්ධ ධර්මය - I

**සැලකිය යුතුයි**

i. **සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න**

ii. අංක **01** සිට **40** තෙක් ප්‍රශ්න වලදී දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් **නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

iii. **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

**1.** බෝසත් උපත ලොව සිදුවූ අසිරිමත් සිදුවීමකි. දෙවියන් ආරාධනා කළ පමණින් බෝසතාණන් වහන්සේ එය පිළිනොගත්හ. අවසන් උපත සඳහා නුවණින් විමසා බැලීම හඳුන්වන්නේ ,

(1) සත්‍ය ක්‍රියා කිරීම ලෙසය
(2) පංචමහා විලෝකනය ලෙසය
(3) පූර්වාදර්ශයක් ලබාදීම ලෙසය
(4) මහා අභිනිෂ්ක්‍රමණය ලෙසය

**2.** සුද්ධෝදන රජතුමාගේ එකම අභිලාෂය තම පුතුට කාමභෝගී ජීවිතයට අවශ්‍ය සියල්ල සකසා තම පුතු ලොව සක්විති රජු වනු දැකීමයි. එම කාමභෝගී ජීවිතය සිදුහත් කුමරුට

(1) සුවදායක විය.
(2) ආශාවන් වැඩි කරවීය.
(3) අභියෝගයක් විය.
(4) සැපයක්ම විය.

**3.** "මෙවන් පුතකු ලද මවක් පියෙක් නිවුනෝ වෙති." යනුවෙන් නිබ්බුත පද ප්‍රකාශ කරන ලද්දේ,

(1) මහාමායා දේවිය විසිනි.
(2) යශෝදරා දේවිය විසිනි.
(3) ප්‍රජාපති දේවිය විසිනි.
(4) කිසාගෝතමිය විසිනි.

**4.** ලෙඩවීම , මහලු වීම , මරණයට පත්වීම ඉපදුණු අප සැමටම පොදු ධර්මතාවයකි. මෙම ජීවිත යථාර්ථයට සැම සත්වයකුම මුහුණ දිය යුතුය. එසේ නම් අපි කළ යුත්තේ,

(1) නිතරම සතුටින් කාලය ගත කිරීමයි.
(2) ප්‍රශ්න ඉදිරියේ හඬා වැලපීමයි.
(3) ජීවිත අභියෝග ජයගැනීමට ධර්මානුකූල ව කටයුතු කිරීමයි.
(4) ප්‍රශ්න වලින් පලායෑමයි.

**5.** බුදුරජාණන් වහන්සේ විසින් ස්වකීය ශ්‍රාවකයන් හඳුන්වන ලැබුවේ භික්ඛු නාමයෙනි. භික්ඛු සමූහය ඇතුලත් සංඝ සමාජය ආරම්භ වන්නේ,

(1) මුල් රහත් හැට නමදෙනා මහණ වීමෙනි.
(2) පස්වග තවුසන් මහණ වීමෙනි.
(3) සැරියුත් මුගලන් දෙනම මහණ වීමෙනි.
(4) තුන්බෑජටිලයන් මහණ වීමෙනි.

**6.** ගිහි සමාජ ධර්මයේ ඇති මිථ්‍යා මත නිවැරදි කර සාමකාමී දිවිපෙවෙතකට යොමු කිරීමේ පිරිසිදු සමාජ නායකත්වය පැවරී ඇත්තේ,

(1) ගුරුවරුන්ටය.
(2) වැඩිහිටියන්ටය.
(3) මහා සංඝරත්නයටය.
(4) සමාජ සේවකයන්ටය.

Learning Resource Center
R
De Mazenod College
Kandana

[දෙවැනි පිටුව බලන්න

7. බෞද්ධයකු වීමේ පළමු පියවර වන්නේ,
   (1) පන්සල් යෑමයි.
   (2) තෙරුවන් සරණ යෑමයි.
   (3) භක්තිවන්තයකු වීමයි.
   (4) ශ්‍රද්ධාවන්තයකු වීමයි.

8. සංඝරත්නයේ ගුණ ගණනින්,
   (1) 6කි.
   (2) 7කි.
   (3) 8කි.
   (4) 9කි.

9. අප කරන සියල්ල පිරිසිදු දිය බඳුනක් සේ විනිවිද පෙනේ. රහසින්වත් පව් නොකළ යුතුය. **අරහං** ගුණය අපගේ ජීවිතයට එකතු කරගත යුතුය. එවැනි උතුමන්,
   (1) සමාජයේ ගෞරවයට , පූජාවට ලක් වෙයි.
   (2) බොහෝදෙනා කැමති වෙයි.
   (3) සමාජශීලී වෙයි.
   (4) ආශාවන්ට ලැදි වෙයි.

10. සිත කැලඹුණු විට, නොසන්සුන් වූ විට, මතකය අවදි නොවේ. එම නීවරණ ධර්මය නම්,
   (1) කාමච්ඡන්දයයි.
   (2) ව්‍යාපාදයයි.
   (3) උද්දච්ච කුක්කුච්චයයි.
   (4) ථීනමිද්ධයයි.

11. භාවනාව සඳහා යොමුවිය යුතු පුද්ගලයා තුළ තිබිය යුත්තේ,
   (1) ඉන්ද්‍රිය සංවරයයි.
   (2) සති සම්පජඤ්ඤයයි.
   (3) සන්තුට්ඨිතාවයයි.
   (4) මේ සියල්ලමයි.

12. සමථ භාවනාව වඩන පුද්ගලයා ආචාර්යවරයකුගේ උපදෙස් ලබයි. පුද්ගල චරිත අනුව කර්මස්ථාන තෝරාගත යුතුය. ඒ සඳහා තෝරාගත හැකි අරමුණු හෙවත් කර්මස්ථාන ගණන වන්නේ ,
   (1) විස්සකි.
   (2) හතළිහකි.
   (3) තිහකි.
   (4) පනහකි.

13. ත්‍රිලක්ෂණ භාවනාව යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
   (1) සමථ භාවනාවයි.
   (2) විදර්ශනා භාවනාවයි.
   (3) චිත්ත භාවනාවයි.
   (4) සමාධි භාවනාවයි:

14. සැප දුක් හා මැදිහත් වීමේදී ඇස, කන ආදී ඉඳුරන්ට රූප, ශබ්ද ආදී අරමුණු හමුවූ විට සිතෙහි ඇතිවන වින්දනය හඳුන්වන්නේ,
   (1) රූපස්කන්ධය යනුවෙනි.
   (2) වේදනා ස්කන්ධය යනුවෙනි.
   (3) සඤ්ඤා ස්කන්ධය යනුවෙනි.
   (4) සමාධි ස්කන්ධය යනුවෙනි.

15. වැලිවිට අසරණසරණ සිරි සරණංකර හිමියන් විසින් රචිත ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ රැසකි. ඉන් එකක් වන්නේ,
   (1) බුදුගුණාලංකාරයයි.
   (2) කාව්‍යශේඛරයයි.
   (3) මුනිගුණාලංකාරයයි.
   (4) සිරිත්මල්දමයි.

16. දුටුගැමුණු රජතුමා විසින් ඉදිකරන ලද චෛත්‍යයකි.
   (1) ථූපාරාමය
   (2) කැලණි විහාරය
   (3) මහාසෑය
   (4) ජේතවනාරාමය

17. උත්සාහවන්ත වූ මනා සිහිය ඇති නිවැරදි දෙය පරීක්ෂාකාරීව හික්මීමෙන් යුතු තැනැත්තාගේ යසස වැඩේ යන අදහස දෙන ධම්මපද ගාථාවේ මුල් පදය වන්නේ,
   (1) අචරිත්වා බ්‍රහ්ම චරියං .....ය.
   (2) උට්ඨානවතෝ සතිමතෝ ......ය.
   (3) නහි වේරේන වේරානි ....ය.
   (4) සබ්බ පාපස්ස අකරණං......ය.

18. බුදුරජාණන් වහන්සේ අප විසින් කළ යුතුදේ ද , නොකළයුතුදේ ද පිළිබඳව දේශනා කළ සේක. නොකළ යුතු දේ හැඳින්වූයේ,
   (1) සමාදාන නමිනි.
   (2) සිරිත් නමිනි.
   (3) විරමණය නමිනි.
   (4) සීලය නමිනි.

**19.** සිඟාලෝවාද සූත්‍රය සමාජ ජාලයකි. එමගින් සමාජය සය ආකාරයකට බුදුරදුන් දක්වා ඇත. මේ අනුව මාපිය දූදරු සබඳතාවය සහ ගුරු ශිෂ්‍ය සබඳතාවය දක්වා ඇත්තේ,
(1) උතුරු දිසාව හා බටහිර දිසාවෙන්ය.
(2) නැගෙනහිර දිසාව හා දකුණු දිසාවෙන්ය.
(3) බටහිර දිසාව හා නැගෙනහිර දිසාවෙන්ය.
(4) උතුරු දිසාව හා නැගෙනහිර දිසාවෙන්ය.

**20.** සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන ආකාරයට දෙමව්පියන් විසින් දරුවන්ට ඉටු නොකළ යුතු කරුණක් වන්නේ,
(1) වරදින් මුදවා ගැනීමයි.
(2) සුදුසු කල්හි සම්පත් පවරාදීමයි.
(3) යහපත් කටයුතුවල යෙදීමයි.
(4) කුල පරපුර ආරක්ෂා කිරීමයි.

**21.** සිඟාලෝවාද සූත්‍රයට අනුව පැවිදි උතුමන්ගෙන් ගිහි ජනතාවට ඉටුවිය යුතු යුතුකම් ගණන,
(1) පහකි.
(2) හයකි.
(3) හතකි.
(4) අටකි.

**22.** ලෝකයේ මිනිසුන් රාගාදි කෙලෙසුන්වලින් මිදී කුසල් උපදවා ගැනීමට උත්සාහ කරමින් පව්කම් කරන්නන් අතර පිංකම් කිරීම බුදුදහමේ හඳුන්වන්නේ,
(1) අනුසෝතගාමී ලෙසය.
(2) පටිසෝතගාමී ලෙසය.
(3) නිර්වාණගාමී ලෙසය.
(4) ධම්මචාරී ලෙසය.

**23.** සිල් රැකීමේදී මෙලොවදීම අපට ආනිසංස හතරක් අත්දැකීම් වශයෙන් ලබාගත හැකිය. පරලොවදී ලබාගත හැකි ආනිසංසය වන්නේ,
(1) මහත් වූ භෝග සම්පත් ලැබීම.
(2) ඕනෑම පිරිසක් මැදට නිර්භවය එළඹීමට හැකිවීම.
(3) සිහිමුලා නොවී කලුරිය කිරීම.
(4) මරණින් මතු සුගතියෙහි ඉපදීම.

**24.** සිඟාලෝවාද සූත්‍රයට අනුව සේව්‍ය සේවක යුතුකම් මනාව ඉටුවේ නම් වර්තමානයේ ඇතිවන වැඩවර්ජන, උද්ඝෝෂණ ආදිය ඇති නොවේ. එසේනම් සේව්‍යයා විසින් සේවකයාට කල යුතු යුතුකම් වලට අයත්වන කරුණක් වන්නේ,
(1) දුන්දෙය පමණක් ගැනීමයි.
(2) වැඩකටයුතු හොඳින් කිරීමයි.
(3) ශක්ති ප්‍රමාණයට වැඩ පැවරීමයි.
(4) ගුණ වර්ණනා කිරීමයි.

**25.** පුද්ගලයෙකුගේ භෝග විනාශයට හෙවත් ධනය විනාශ වීමට හේතුවන කරුණු ඇතුලත් සූත්‍ර දේශනාව වන්නේ,
(1) පරාභව සූත්‍රයයි.
(2) වසල සූත්‍රයයි.
(3) කාලාම සූත්‍රයයි.
(4) සිඟාලෝවාද සූත්‍රයයි.

**26.** ස්වභාවික විපත් සැමට පොදුය. එයට ජාති ආගම් කුලභේද නැත. එවැනි අවස්ථාවක අප ක්‍රියාකළ යුත්තේ,
(1) තමා ගැන පමණක් සිතීමෙනි.
(2) සහජීවනයෙන් සමානාත්මතාවයෙනි.
(3) ජාතිය ගැන පමණක් සිතීමෙනි.
(4) ආගම ගැන පමණක් සිතීමෙනි.

**27.** ගෞතමයන් වහන්ස , මේ ලොව සැමදෙනාම එක හා සමාන නැහැ. ආයුෂ අඩුයි. සමහරුන්ට වැඩියි, දුප්පත් පොහොසත් භේදය , නුවණ අඩු වැඩි වන්නට හේතු කවරේදැ යි" බුදුරජාණන් වහන්සේගෙන් විමසුවේ,
(1) සිගාල ගෘහපතියාය.
(2) ද්‍රෝණ බමුණාය.
(3) සුභ මානවකයාය.
(4) උපාලි ගෘහපතියාය.

**28.** සත්වයන් උස්පහත්, අඩුවැඩි වශයෙන් බෙදනු ලබන්නේ කර්මය නිසා බව බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. මෙහිදී කර්මය යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
(1) සිතාමතා කරනු ලබන ක්‍රියාවයි.
(2) ඉබේම සිදුවන ක්‍රියාවයි.
(3) සත්වයා උස්පහත් වශයෙන් බෙදීමයි.
(4) ස්වභාවික හේතූන් මත සිදුවන ක්‍රියාවයි.

**29.** විපාක දෙන කාලය අනුව කර්මය සතර ආකාර වේ. ඒ අනුව උපපජ්ජවේදනීය කර්මය යනුවෙන් හඳුන්වන්නේ,
(1) මරණින් මතු පළමු ආත්මභවයේදී විපාක දෙන කර්මයයි.
(2) මෙලොවදීම විපාක දෙන කර්මයයි.
(3) විපාක නොදී අහෝසි වන කර්මයයි.
(4) නිවන් දකින තුරුම විපාක දෙන කර්මයයි.

**30.** වෙනත් කර්මයකින් වලකාලිය නොහැකි වඩාත් බලසම්පන්න අකුසල කර්ම ගණයට අයත් පඤ්චානන්තරීය පාප කර්ම,
(1) ආසන්න කර්මවලට අයත් වේ.
(2) ගරුක අකුසල කර්මවලට අයත් වේ.
(3) ආචිණ්ණ කර්මවලට අයත් වේ.
(4) කටත්තා කර්මවලට අයත් වේ.

[හතරවෙනි පිටුව බලන්න

**31.** බුදුදහමේ ඉගැන්වීමට අනුව කිසියම් පුද්ගලයකු යස ඉසුරින් පිරුණු ස්ථානයක උපත ලැබීම,
(1) ගති සම්පත්ති නම් වේ.
(2) උපධි සම්පත්ති නම් වේ.
(3) කාල සම්පත්ති නම් වේ.
(4) ප්‍රයෝග සම්පත්ති නම් වේ.

**32.** මමය, මගේය වශයෙන් සිතින් දැඩි ව අල්වාගෙන කටයුතු කලයුතු සත්‍ය වශයෙන්ම එසේ කිව හැකි කිසිවක් මෙලොව නොපවතින බව ඉගැන්වෙන්නේ,
(1) හේතුඵල දහම මගිනි.
(2) අටලෝ දහම මගිනි.
(3) ත්‍රි ලක්ෂණ දහම මගිනි.
(4) සිව්සස් දහම මගිනි.

**33.** පංච නිවරණ ධර්ම පිළිවෙලින්,
(1) ව්‍යාපාද , ථීනමිද්ධ , උද්දච්චකුක්කුච්ච , විචිකිච්චා , කාමච්ඡන්ද
(2) කාමච්ඡන්ද , ව්‍යාපාද , ථීනමිද්ධ , උද්දච්චකුක්කුච්ච , විචිකිච්චා
(3) කාමච්ඡන්ද , ව්‍යාපාද , උද්දච්චකුක්කුච්ච , විචිකිච්චා , ථීනමිද්ධ
(4) ව්‍යාපාද , කාමච්ඡන්ද , විචිකිච්චා , උද්දච්චකුක්කුච්ච , ථීනමිද්ධ

**34.** අස්සජි මහරහතන් වහන්සේ උපතිස්ස පිරිවැජියාට දේශනා කළ ගාථාවේ මුල් පදය වන්නේ,
(1) අක්කොච්ඡිමං අවධිමං ......ය.
(2) යේධම්මා හේතුප්පභවා ......ය.
(3) චේතනාහං භික්කවේ කම්මං වදාමි......ය.
(4) යාදිසං වපතේ බීජං ........ය.

**35.** මෙය ඉපදීමෙන් මෙය උපදී." යන සිංහල තේරුම ඇති පාළි පාඨය වන්නේ,
(1) ඉමස්මිං සති ඉදං හෝති වේ.
(2) ඉමස්ස උප්පාදා ඉදංඋප්පජ්ජති වේ.
(3) ඉමස්මිං අසති ඉදං න හෝති වේ.
(4) ඉමස්ස නිරෝධ , ඉදං නිරුජ්ඣති වේ.

**36.** බුදුරජාණන් වහන්සේ විසින් බරණැස ඉසිපතනයේදී දෙසූ, චතුරාර්ය සත්‍යය ධර්මය ඇතුළත් සම්බුද්ධ දේශනාව වන්නේ,
(1) දම්සක් පැවතුම් සූත්‍රයයි.
(2) අනත්ත ලක්ඛණ සූත්‍රයයි.
(3) චුල්ලකම්ම විභංග සූත්‍රයයි.
(4) සිඟාලෝවාද සූත්‍රයයි.

**37.** දුක්ඛ ආර්ය සත්‍යයට අනුව සසර දුක,
(1) තුන් ආකාර වේ.
(2) සතර ආකාර වේ.
(3) දෙආකාර වේ.
(4) පස්ආකාර වේ.

**38.** තම චරිත ලක්ෂණ වලට අනුව පුද්ගල චරිත 6කි. එම චරිතයන්ට අයත් නොවන්නේ,
(1) රාග චරිතයයි.
(2) මෝහ චරිතයයි.
(3) විතර්ක චරිතයයි.
(4) කාම චරිතයයි.

**39.** සත්වයා සසර බැඳ තබන නැවත ඉපදීමට හේතුව වන්නේ තණ්හාව බව, චතුරාර්ය සත්‍යයේ දක්වා ඇත්තේ,
(1) දුක්ඛ ආර්ය සත්‍යය මගිනි.
(2) දුක්ඛ සමුදාර්ය සත්‍යය මගිනි.
(3) දුක්ඛ නිරෝධාර්ය සත්‍යය මගිනි.
(4) දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය මගිනි.

**40.** බුදුරජාණන් වහන්සේගෙන් , ඔබ දෙවියෙක් ද?, ගාන්ධර්වරයෙක් ද?, යක්ෂයෙක් ද?, මනුෂ්‍යයෙක් දැයි පිළිවෙලින් අසා සිටියේ,
(1) චංකී බ්‍රාහ්මණයා ය.
(2) උපාලි ගෘහපතියාය.
(3) ද්‍රෝණ බමුණාය.
(4) අභයරාජ කුමාරයාය.

24 - 07 - 2019

De mezenod college - kandana De mezenod college - kandana De mezenod college - kandana De mezenod -

NEW

# ද මැසිනොද් විදුහල - කඳාන
# De mezenod college - kandana

| 11 | S | II |
|---|---|---|

10 ශ්‍රේණිය

## දෙවන වාර පරීක්ෂණය - 2019

පැය තුනයි

## බුද්ධ ධර්මය - II

**සැලකිය යුතුයි**

- ❖ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- ❖ පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් දතෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

**1.**

(I) සිදුහත් කුමාරයාට ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වූ බමුණු පඬිවරයාගේ නම කුමක් ද?

(II) බුදු දහමේ ඉගැන්වෙන රෝග දෙයාකාරයකි. ඒ මොනවාද?

(III) බුදුන් වහන්සේ විසින් ස්වකීය ශ්‍රාවකයන් හඳුන්වන ලද්දේ කිනම් නාමයකින්ද?

(IV) සමාධි භාවනාව සඳහා යොමුවන පුද්ගලයෙක් තුළ තිබිය යුතු ගුණාංගයන් වන්නේ මොනවාද?

(V) ඇත්ත ඇති සැටියෙන් දැකීමේ නුවණ බුදු දහමේ හඳුන්වා ඇත්තේ කිනම් නමකින්ද?

(VI) අටලෝ දහම් යනු කුමක්ද? නම් කරන්න.

(VII) බුදුන් වහන්සේ ජීවමාන කාලයේදී උපයාගත් සියලු ධනය අහිමිකොට ඇඳි වතට පමණක් සීමාවූ සිටුවරයා කවුරුන්ද?

(VIII) අත්තූපනායික ධර්ම යනු කුමක්ද? පැහැදිළි කරන්න.

(IX) දුක තුන් ආකාර යැයි ධර්ම විවරණවල දැක්වේ. එම ආකාර තුන නම් කරන්න.

(X) සිදුහත් බෝසතාණන් වහන්සේ නිර්වාණය සොයායන ගමනේදී අත් හරින ලද අන්ත දෙක වනුයේ,

**2.**

(1) ධම්ම පදය අයත් වන්නේ සූත්‍ර ත්‍රිපිටකයේ කවර නිකායකටද?
(2) "උට්ඨාන වතෝ සතිමතෝ" ගාථාව සම්පූර්ණ කරන්න.
(3) ඉහත ධම්ම පද ගාථාවට අනුව ප්‍රීතිමත් සාර්ථක ජීවිතයක් ගත කිරීමට පුද්ගලයෙකු සතු වියයුතු ගුණධර්ම කවරේද විස්තර කරන්න.

**3.**

(1) සීලයෙහි ප්‍රධාන කොටස් දෙකකි. නම් කරන්න.
(2) බුද්ධ දේශනයට අනුව සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස මොනවාද?
(3) සිල් පද ආරක්ෂා කිරීම පාසල් සිසුවෙකුට වැදගත් වන ආකාරය පැහැදිළි කරන්න.

**4.**

(1) කර්මය ක්‍රියාත්මක වන දොරටු තුනකි. නම් කරන්න.
(2) කර්මය යනු කුමක්ද? කෙටියෙන් පැහැදිලි කරන්න.
(3) කර්මය කුසල අකුසල වශයෙන් සත්වයා උස් පහත් වශයෙන් බෙදයි. පැහැදිළි කරන්න.

Learning Resource Centre
R
De Mazenod College
Kandana

[දෙවැනි පිටුව බලන්න

5.

(1) "හේතුං පටිච්ච සම්භූතං - හේතු භංගං නිරුජ්ඣති" යන්නෙහි තේරුම ඔබේ වචනයෙන් ලියන්න.

(2) චතුරාර්ය සත්‍යය තුළ දක්වා ඇති උතුම් සත්‍ය හතර පිළිවෙලින් නම් කරන්න.

(3) සාමාන්‍ය ජීවිතයේ ගැටලු මුලින් උපුටා දැමීමට ස්ථිර විසඳුම් සෙවීමට චතුරාර්ය සත්‍යය තුළින් ලබාගත හැකි ආදර්ශය පැහැදිලි කරන්න.

6. පහත සඳහන් තේමා අතරින් **දෙකක්** පිලිබඳ විස්තර කරන්න.

(1) පද්මාකාර ජීවිතය.

(2) නිරෝගී බව උතුම් ලාභයයි.

(3) අසරණ සරණ සරණංකර හිමි.

(4) සිඟාලෝවාද සූත්‍රය.